# දකුණු පළාත් සභාව

## රුහුණු සංචාරක කාර්යාංශය

## තනතුරු පුරප්පාඩු

දකුණු පළාත් සභාවේ රුහුණු සංචාරක කාර්යාංශයේ පවතින පහත සඳහන් තනතුරේ පුරප්පාඩුව සඳහා දකුණු පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලබන අතර, දකුණු පළාතෙන් පිටත පදිංචිකරුවන්ගේ අයදුම්පත් පිළිබඳවද සලකා බලනු ලැබේ.

### 01. කළමනාකාර අධ්‍යක්ෂ (තනතුරු 01)

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් හා පළපුරුද්ද**

සංචාරක විෂය ක්ෂේත්‍රය හා කළමනාකරණ විෂයද ඇතුළුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු සංචාරක විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳ මනා හැකියාවක් තිබීම

සහ

ප්‍රජා සම්බන්ධතාවය සහ මනා සංනිවේදන කුසලතාවයකින් යුක්ත වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම් හා පළපුරුද්ද**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | : | MM-1-1-2016 = රු (53,175-10X1,375-15X1,910-95,575) |
| **මූලික පියවර** | : | රු. 53,175.00 |
| **වයස** | : | සෑම ඉල්ලුම්කරුවෙකුම අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**වෙනත් සුදුසුකම් :**

1. පූර්වාසන්න වසර තුන (03) ක කාලය තුළ දකුණු පළාතේ ස්ථිර පදිංචි අයකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
4. ඉහත තනතුර ස්ථිර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
5. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් දැන්වීමේ සඳහන් සුදුසුකම් හා සමාන වෙනත් සුදුසුකම් ඇති අය පිළිබඳ ව ද සලකා බලනු ලැබේ.
6. සෑම අවස්ථාවකම සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව ඇති විශේෂිත දැනුම කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබාදෙනු ඇත.

සම්පූර්ණ විස්තර සහිත ඔබ විසින් සකස්කරන ලද ජීව දත්ත සහිත අයදුම්පත්, කවරයේ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර 2020 ජූලි 16 වන දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය, අංක 153 බී, එස්.එච්. දහනායක මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය,**
**අංක 153 බී, එස්.එච්. දසනායක මාවත,**
**ගාල්ල.**
**වෙබ් - www.southernsrilanka.lk**

Source: Dinamina, Daily News (2020.06.25)